# පොලිසියේ රාජකාරි සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් 5000ක්

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටයින් සහ කාන්තා භටයින් 2500 කට ආසන්න පිරිසක් අද (10) සිට පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය සඳහා අනුයුක්ත කිරීමට නියමිත බව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව පුවත් නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කරයි.

ඒ අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තම්නේතුවට අයත් සාමාජික සාමාජිකාවන් 2477 ක් පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා සහයට ලබාදීමට කටයුතු කරන අතර මේවනවිට 5000 කට ආසන්න සිවිල් ආරක්ෂක භට පිරිසක් පොලිස් දෙපාර්තම්න්තු රාජකාරි සහයට අනුයුක්ත කර ඇත.

පළමු අදියර යටතේ පොලිස් සහයක සේවා සඳහා අනුයුක්ත කරන මෙම පිරිස ස්ථානීය ආරක්ෂක රාජකාරි, අධිකරණ ආරක්ෂක රාජකාරි, ප්‍රභූ නිවාස ආරක්ෂක රාජකාරි, විශේෂයෙන් ආරක්ෂා කලයුතු ස්ථානවල ආරක්ෂක රාජකාරි, මුර සංචාර රාජකාරි සහයක, ජංගම සංචාර රාජකාරි සහයක වශයෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා යොදවනු ලබයි. පොලිස් දෙපාර්තම්නේතුව වෙත අනුයුක්ත කරන මෙම භටයින් විල්පත්තුව අනුරාධපුරය, හොරොව්පතාන, උහන, කැබිතිගොල්ලෑව, වැලිඔය, මහඔය, අම්පාර, පුත්තලම, ත්‍රිකුණාමලය, ගෝමරන්කඩවල, සේරුවිල, පොළොන්නරුව, මැදිරිගිරිය, මුලතිව්, කිලිනොච්චිය, මොණරාගල යන පොලිස් ස්ථානවල සේවය සඳහා යෙදවීමට නියමිත බව එම නිවේදනය තවදුරටත් ප්‍රකාශ කරයි.